ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

ස්වභාවික විද්‍යා පීඨය

විද්‍යාවේදී උපාධි පාඨමාලාව

රසායන විද්‍යා දෙපාර්තමේන්තුව

නීතිය පිළිබඳ අවබෝධය **LLU3261**

අවසාන පරීක්ෂණය

කාලය - පැය දෙකයි

| දිනය: 21-10-2022 | වේලාව: ප.ව.2.00-4.00 |
|---|---|

මුලු ප්‍රශ්න සංඛ්‍යාව - 07

ප්‍රශ්න හතරකට (04) පමණක් පිලිතුරු සපයන්න.

(1) (අ) නීතිය යනු ඕනෑම සංවිධිත නූතන සමාජයක කේන්ද්‍රීය කොටසකි. නීතියේ කාර්යභාරයන් මොනවාද?

(ලකුණු 5)

(ආ) පහත ප්‍රකාශ සමග ඔබ එකග වන්නේ? හේතු දක්වමින් පැහැදිලි කරන්න.

(අ) ශ්‍රී ලංකාවේ නීති පද්ධතියේ තිබෙන එක් සුවිශේෂී ලක්ෂණයක් නම් යම් යම් නිශ්චිත ජන කොට්ටාශවලට බලපාන පුද්ගල නීති (විශේෂ නීති) පද්ධති කිහිපයක් පැවතීමයි.

(ආ) ඕනෑම සමාජයක නෛතික නියමයක (නීතිය) පැවැත්ම අපට යම් මූලාශ්‍රයක් තුලින් හදුනාගත හැක. ඕනෑම නීති පද්ධතියක් තුල මෙම නීති මූලාශ්‍ර ධූරාවලිගත ලෙසකට සංවිධානය කොට තිබේ.

(10 × 2= ලකුණු 20)

(ලකුණු 25)

(2) පහත සිදුවීම්වල එන පාර්ශවයන්ට ඔවුන් තම නඩුව ගොනු කල යුතු අධිකරණය කවරේද යන්න සම්බන්ධව උපදෙස් දෙන්න.

(අ) සුනිල් ප්‍රමුඛ පෙලේ පෞද්ගලික සමාගමක සේවකයෙකි. සාවද්‍ය චෝදනා මත ඔහුගේ සේවය කලමණාකාරීත්වය අවසන් කරයි. ඒ කිසිදු විනය පරීක්ෂණයක් හෝ නොතබමිනි.

THE OPEN UNIVERSITY OF SRI LANKA

FACULTY OF NATURAL SCIENCES

DEPARTMENT OF CHEMISTRY

BSC DEGREE PROGRAMME

UNDERSTADING LAW LLU3261

FINAL EXAMINATION

DURATION 2 HOURS

| Date: 21-10-2022 | Time: 2.00-4.00 PM |
|---|---|

Total number of questions – 07

Answer only four (04) questions.

(1) (A) Law is an integral part of any organized modern society. What are the functions of law?

(5 marks)

(B) Do you agree with following statement? Explain with providing reasons.

(a) One of the salient features of the Sri Lankan legal system is the existence of different systems of personal laws (special laws) applicable to specific communities.

(b) In any society, the existence of a legal rule (law) is traceable to a particular source. In any legal system, these sources are organized in a hierarchical manner.

($10 \times 2 = 20$ marks)

(25 marks)

(2) Advice the following parties about the court of law that they should refer their case.

(a) Sunil is an employee of a leading private company. His services are terminated by the management based on a falsified charge, without conducting a disciplinary inquiry.

(ආ) සුරාජ් හා ඉරාජ් යන සොහොයුරන් තම දෙමාපියන්ගේ උරුමයෙන් ලද ඉඩමක් හවුලේ භුක්ති විදිති. ඉරාජ්ව ඉඩමෙන් පලවා හරින සුරාජ් මුලු ඉඩමම තමාට අයිති යැයි කියා සිටී. ඉරාජ් මේ සම්බන්ධ ප්‍රතිකර්ම පතයි.

(ඇ) ආණ්ඩුව පිලිබඳ සිය අප්‍රසාදය පල කිරීම සඳහා විශ්ව උද්ඝෝෂණ පෙලකට සම්බන්ධ විය. දිනෙක උද්ඝෝෂණයක් අවසන් වී ගෙදර යමින් සිටින අතර, ඔහුට පොලිස් නිලධාරියෙක් පහර දුන්නේය. ඒ උද්ඝෝෂණවලට සම්බන්ධ නොවන ලෙසට තර්ජනය කරමිනි.

(ඈ) රාජු ඒබීසී නම් රජයේ විශ්ව විද්‍යාලයේ සිසුවෙකි. විශ්ව විද්‍යාලයට එන විට විධිමත් ඇඳුමකින් සැරසී ආ යුතු බව කියමින් විශ්ව විද්‍යාලය චක්‍රලේඛයක් නිකුත් කලේය. විශ්ව විද්‍යාල පාලනාධිකාරිය තම බල සීමාවෙන් ඔබ්බට ගොස් ක්‍රියා කරන බවට රාජු කල්පනා කරයි.

(ඉ) ධර්මිකා ලක්ෂමන් සමග විවාහ වී සිටී. ලක්ෂ්මන් අනියම් සබඳතා පවත්වන බවට දැනගත් පසුව ධර්මිකා ඔහුගෙන් දික්කසාද වීමට අපේක්ෂා කරයි.

(5×5 = ලකුණු 25)

(3) (අ) ඩයිසි නීතියේ ආධිපත්‍යය නිර්වචනය කරන්නේ කෙසේදැ'යි දක්වන්න. (ලකුණු 5)

(ආ) (අ) පාර්ලිමේන්තුවේ ස්වාධිපත්‍යය පිලිබඳ සංකල්පය තුලින් අපේක්ෂා කරන්නේ පරමාධිපත්‍යය ජනතාව සතු බවත්, ජනතාව තමා විසින් තෝරාපත් කරගත් නියෝජිතයන් මාර්ගයෙන් එම පරමාධිපත්‍යය අභ්‍යාස කරන බවටත් සහතික කිරීමය.

පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය සංකල්පයේ පැතිමාන කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(ආ) අධිකරණයේ ස්වාධීනතාවය නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කරගැනීම සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය වේ. අධිකරණ ස්වාධීනත්වය සම්බන්ධයෙන් වන 1978 ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන කෙරෙහි අවධානය යොමු කරමින් නීතියේ ආධිපත්‍යය හා අධිකරණයේ ස්වාධීනතාවය අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

(10×2= ලකුණු 20)

(ලකුණු 25)

(4) පහත දැක්වෙන අවස්ථාවල කඩ වීමට ලක්විය හැකි අයිතිවාසිකම් මොනවාදැ'යි සාකච්ඡා කරන්න.

(අ) රාජිත පුවත්පත් කතුවරයෙකි. කතුවැකි පල කිරීමට පෙර අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයට ඒවා යොමු කොට අවසර ගැනීම අනිවාර්යය කරමින් නව චක්‍රලේඛයක් ආණ්ඩුව විසින් නිකුත් කරයි.

(b) Suraj and Iraj are brothers who also co-own a portion of land inherited from their parents. Suraj evicts Iraj from the land, and claims the entire portion belongs to him. Iraj is seeking for a remedy.

(c) Vishwa participated in a series of protests to express his displeasure to the government. One day, when coming home after the protest, he was assaulted by a police officer who threatened him not to attend protests.

(d) Raju is a student at the ABC university. The university decides to introduce a new circular making it mandatory for students to wear formal attire to the university. Raju thinks the university administration is acting beyond its powers.

(e) Dharmika is married to Lakshman. Upon finding that Lakshman is cheating on her, Dharmika seeks to obtain a divorce.

(5×5 = 25 marks)

(3) (A) State how Dicey defines rule of law. (5 marks)

(B) (a) The concept of supremacy of the parliament envisions that the sovereignty lies with the people, and people exercise sovereignty through elected representatives.

Discuss the above statement by elaborating on the features of the concept parliamentary supremacy.

(b) Judicial independence is integral to preserve rule of law. Discuss the interrelationship between the rule of law and independence of the judiciary with giving special attention to the provisions of the 1978 Sri Lankan constitution on judicial independence.

(10×2=20 marks)

(25 marks)

(4) Discuss the rights that are possibly infringed in the following scenarios.

(a) Rajitha is an editor of a newspaper. The government introduces a new circular requiring all editors to obtain prior approval for their editorials from the ministry of internal affairs before the editorial is published.

(ආ) සුමයියා කාන්තා අනුගාමිකාවන් යම් නිශ්චිත ඇඳුමක් ප්‍රසිද්ධ ස්ථානවල හැඳිය යුතු බවට අපේක්ෂා කරන සුළුතර ආගමික ප්‍රජාවක සාමාජිකාවකි. ආරක්ෂක අමාත්‍යංශය මෙම ඇඳුම භාවිතා කිරීම තහනම් කරයි.

(ඇ) ලෝක ප්‍රකට විශ්ව විද්‍යාලයකින් දර්ශනසූරී උපාධියක් ලබාගන්නා සරත් රාජ්‍ය විශ්ව විද්‍යාලයක කථිකාචාර්ය තනතුරකට අයැදුම් කරයි. හේ විශ්වාසයෙන් යුක්තව සම්මුඛ සාකච්ඡාවට මුහුණ දෙයි. පසුව ඔහුට දැනගන්නට ලැබෙන්නේ සුදුසුකම්වලට වඩා ඔහුට වඩා පසුපසින් සිටින, එහෙත් බලවත් දේශපාලනඥයෙක්ගේ අනුග්‍රහය ලබන පුද්ගලයෙක්ව සම්මුඛ සාකච්ඡාවෙන් තෝරාගත් බව හා ඔහුගේ නම ප්‍රතික්ෂේප කරන ලද බවත්ය.

(ඈ) සුළු අපරාධයකට සැක පිට පොලිසිය මාරන්ව අත්අඩංගුවට ගනී. පොලිස් ස්ථානයේ ඔහුව රඳවා තබයි. අත්අඩංගුවට ගත් දවසේ රාත්‍රියේ බීමත් පොලිස් නිලධාරීන් පිරිසක් පැමිණ ඔහුව කුටියෙන් එලියට ගෙන බලවත් ලෙස තුවාල වන පරිදි පහර දීමක් සිදු කරයි.

(ඉ) ගුරු නවකථාකරුවෙකි. ඔහුගේ අලුත්ම නවකථාවේ තේමාව ආගමික ස්ථානවල සිදුවන ළමා අපචාර සම්බන්ධවය. මෙම පොත පළ කිරීමෙන් පසුව, දැඩි මතධාරී ආගමික කණ්ඩායම් ගුරුට එරෙහි විරෝධය පළ කරයි. සංස්කෘතික කටයුතු ඇමතිවරයා නවකථාව තහනම් කිරීමට තීරණය කරයි.

(5 × 5 = ලකුණු 25)

(5) පහත දැක්වෙන සිදුවීම්වල පාර්ශවයන්ගේ අයිතිවාසිකම් සාකච්ඡා කරන්න.

(අ) අනුෂ්කාට ලැප් ටොප් යන්ත්‍රයක් විකිණීමට නාමල් අර්පණය කරයි. නාමල් අර්පණය කරන්නේ ඔහුගේ ඩෙල් ලැප්ටොප් යන්ත්‍රය විකිණීමට බව සිතමින් අනුෂ්කා අර්පණය ප්‍රතිග්‍රහණය කරයි. ලැප් ටොප් පරිගණකය ලැබුණු පසුව, නාමල් අපේක්ෂා කලේ ඔහුගේ ඩෙල් ලැප් ටොප් යන්ත්‍රය නොව ලෙනොවෝ පරිගණකය විකිණීමට බව අනුෂ්කාට දැනගන්නට ලැබේ.

(ආ) වෛද්‍යවරයෙක් වන කුමරන් තමාගේ වයස්ගත රෝගියෙක් වන ඒබ්‍රහම් මහතාට ඔහුගේ පාරම්පරික නිවස කුමරන්ගේ නමට ලියන ලෙසට ඒත්තු ගන්වයි. කුමරන් තම තනතුර පෞද්ගලික වාසිය සඳහා භාවිතා කල බවට ඒබ්‍රහම් මහතාගේ ඥාතීන් චෝදනා කරති.

(ඇ) ප්‍රකාශ් නිවාඩු කාලයේ දී මැලේසියාවේ සංචාරයක් සඳහා යන බවට තම බිරිඳ වන ශානිට පොරොන්දු වේ. එහෙත් මූල්‍ය දුෂ්කරතා නිසා ප්‍රකාශ්ට පොරොන්දුව ඉටු කිරීමට නොහැකි විය. ව්‍යාජ පොරොන්දුවක් දීම මත ප්‍රකාශ්ට එරෙහිව නඩු දැමිය යුතු බවට ශානිගේ යහලුවන් ඇයට පවසති.

(ඈ) මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙක් වන චන්දන් සිරාජ් නම් ව්‍යාපාරිකයාට ඔහු සතු කාර්යාලය චන්දන්ගේ මිත්‍රයෙක්ට අඩු මුදලකට බදු දෙන ලෙසට බලපෑම් කරයි. චන්දන් තම පවුලට හානි කරනු ඇතැ'යි බිය වන සිරාජ් බදු ගිවිසුමට අත්සන් කිරීමට තීරණය කරයි.

(b) Sumaiya belongs to a minority religious group of which the teachings require female devotees to wear a particular attire when appear in public. The defense ministry bans the use of the attire.

(c) Sarath earns a doctoral degree from a world-renowned university and applies to an academic position in a public university. He faces the interview with confidence. But later he gets to know that a candidate who is less qualified than him but having the backing of a powerful politician is selected and his name is rejected by the interview panel.

(d) Maran is arrested by the police on the suspicion that he has committed a petty offence. He was detained at the police station. At the night of the day of arrest, some drunk police officials take Maran out from the cell and severely beats him causing serious injuries.

(e) Guru is a fiction writer. The theme of his newest novel is about child abuse that take place in religious institutes. After the publication of the book, certain hardcore religious believers create an outrage against Guru. The minister of cultural affairs decides to ban the novel.

(5 × 5 = 25 marks)

(5) Discuss the rights of the parties in the following instances.

(a) Namal offers to sell a laptop to Anushka. However, Anushka on the belief that Namal has offered to sell a Dell laptop, accepts the offer. Upon delivery, Anushka gets to know that Namal had intended to sell his Lenovo laptop instead of the Dell laptop.

(b) Kumaran, who is a doctor, convinces his old age patient Mr. Abraham to transfer the deed of his ancestral home to Kumaran's name. Mr. Abraham's relatives accuse Kumaran of using his position for his personal advantage.

(c) Prakash promises his wife Shani to take her for a vacation in Malasiya during the holiday season. However, due to financial difficulties, Prakash fails to do so. Shani's friends insist that she should sue Prakash for making a false commitment.

(d) Chandan, who is a drug lord threatens businessman Siraj to lease his office premises to a friend of Chandan for a under priced value. Siraj agrees to sign the lease agreement fearing that Chandan would harm his family.

(ඉ) චාන්දනී පහළොස් හැවිරිදි පාසල් දැරියකි. ඇයගේ විසි එක් හැවිරිදි පෙම්වතා වන ජනක ඇයට දෙමාපියන්ගෙන් ත්‍යාග ලෙස ලැබුණු වටිනා මාලය ජනකගේ සොහොයුරියට විකුණන ලෙසට පෙලඹවීම් කරයි. මේ පිළිබඳ දැනගත් පසුව චාන්දනීගේ දෙමාපියන් කෝපයට පත්වේ.

(5×5 = ලකුණු 25)

(6) පහත මාතෘකා ගැන කෙටි සටහන් ලියන්න.

(a) අර්පණයක් ඉල්ලා අස් කරගැනීම.
(b) වගකීමෙන් මුක්ත කරන වගන්ති.
(c) අර්පණය සලකා බැලීම සඳහා කරන ආරාධනාව.
(d) ප්‍රති-අර්පණය.
(e) නීති විරෝධී ගිවිසුම්.

(5×5 = ලකුණු 25)

(7) (අ) රටේ ජීවත් වන කම්කරුවන්ට අවම ආරක්ෂණයක් ලැබෙන බවට සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකය විසින් නීති මාලාවක් සම්මත කොට තිබේ. පාර්ලිමේන්තුව විසින් සම්මත කොට තිබෙන එබඳු නීති තුනක් (03) තෝරාගෙන ඒවායේ කාර්යභාරය හා කම්කරු සුබසාධනයට ඒවා උපකාරී වන අන්දම සාකච්ඡා කරන්න. (ලකුණු 15)

(ආ) සේවකයෙක් ස්වාධීන ගිවිසුම්කරුවෙක්ගෙන් වෙන් කර ගැනීම සඳහා අධිකරණ විසින් භාවිතා කොට තිබෙන විවිධ පරීක්ෂණ කවරේදැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ලකුණු 25)

***

(e) Chandani is a 15-year-old schoolgirl. Janaka, his 21-year-old boyfriend convinces her to sell her valuable necklace given by her parents as a birthday gift to sister of Janaka. Chandani's parents become outrageous after hearing the news.

(5×5 = 25 marks)

(6) Write short notes on the following.

(a) Revocation of an offer
(b) Exemption clauses
(c) Invitation to treat
(d) Counter offer
(e) Illegal contracts

(5×5 = 25 marks)

(7) (a) The Sri Lankan legislature has adopted a series of laws to ensure that the workers in the country are given at least a minimum level of protection and they can live a dignified live. Select three (03) legislations the parliament has enacted to ensure labour welfare and discuss their functions.

(15 marks)

(b) Explain the different tests use by the courts to differentiate a worker from an independent contractor.

(10 marks)

(25 marks)

***